ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි තෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 ජන/පෙබ/මාර්තු

**ආර්ථික විද්‍යාව**

**ECON 3220.03 - තුලනාත්මක ආර්ථික සංවර්ධනය**

**කාලය පැය තුනයි (03)**

---

ඕනෑම ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු පයන්න.

---

01. (අ) කාල් මාක්ස්ගේ නිෂ්පාදන මාදිලිය (Mode of production) පිළිබඳ විග්‍රහය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

(ආ) රොස්ටෝව්ගේ ආර්ථික වර්ධන ආකෘතිය මාක්ස්ගේ නිෂ්පාදන මාදිලියෙන් වෙනස් වන්නේ කෙසේද?

**(ලකුණු 08)**

02. (අ) පූර්ව ධනේශ්වර යුගයේ එංගලන්තයේ නින්දගම් ක්‍රමය තුළ ' ඍජු නිෂ්පාදකයාගේ ' ආර්ථික කාර්යභාරය විස්තර කරන්න.

**(ලකුණු 06)**

(ආ) ' ඍජු නිෂ්පාදකයාට ' තම නිෂ්පාදන මාධ්‍යයන් අහිමි කරලීමට හේතු වූ කරුණු පෙන්වා දෙන්න.

**(ලකුණු 10)**

03. (අ) එංගලන්තයේ කෘෂිකාර්මික විප්ලවය සඳහා හේතු වූ කරුණු සඳහන් කරන්න.

**(ලකුණු 10)**

(ආ) ශක්තිමත් කෘෂිකාර්මික පදනම එංගලන්තයේ කාර්මික සංවර්ධනය සඳහා හේතු වූ ආකාරය කෙසේදැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

04. එංගලන්තයේ සහ ජපානයේ පැවති වැඩවසම් ක්‍රමවල සමාන සහ අසමාන ලක්ෂණ පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

(ලකුණු 16)

05. (අ) වාණිජවාදයේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ආ) යටත්විජිත යුගයේ ඇමරිකාවේ වෙළදාම සහ වාණිජ කටයුතු වර්ධනය සහ ප්‍රසාරණය වූ ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

06. (අ) මේජි (Meiji) ප්‍රතිසංස්කරණ කෙටියෙන් සඳහන් කරන්න.

(ලකුණු 06)

(ආ) මේජි (Meiji) ප්‍රතිසංස්කරණ ජපානයේ ආර්ථික සංවර්ධනයට කුමන අයුරින් දායක විනිදැ යි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

07. (අ) ඉහළ හැකියාවක් සහිත ආසියානු ආර්ථිකයක් (HPAEs) යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(ලකුණු 04)

(ආ) ආසියානු ආර්ථිකයන්හි ඉහල හැකියාවන් සඳහා දායකත්වය දැක්වූ ආර්ථික ප්‍රතිපත්ති මොනවාදැ යි සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

***********